7th International Conference of Multidisciplinary Approaches (iCMA), 2020
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# ඌවේ ශාන්තිකර්මයන්හි භාවිත මණ්ඩප පුරාණ සාහිත්‍යයෙන් ප්‍රකට වන භරතමුනි නාට්‍ය ශාස්ත්‍රයේ මූලධර්ම

චන්ද්‍රසේකර සී.එම්.ආර්.පී.

ලලිත කලා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
ramithpreshal04@gmail.com

**සාරසංක්ෂේපය**
රටට ඇති වන උපද්‍රව දුරුකර සෙත් ශාන්තියක් ඇති කිරීම අරමුණු කර ගනිමින් ඌව පළාතේ පත්තිනි දෙවියන් මූලික කර පැවැත්වෙන ප්‍රධාන ශාන්තිකර්මයක් ලෙස ගී මඬු ශාන්තිකර්මය හඳුන්වා දිය හැකි ය. සූනියම නමින් ද ශාන්තිකර්මයක් ඌව ප්‍රදේශය ආශ්‍රිත ව පවත්වනු ලැබේ. එම ශාන්තිකර්මය පැවැත්වීමේ ප්‍රධාන පරමාර්ථය නම් මිනිසා විසින් මිනිසාට සිදු කරනු ලබන අන-වින කොඩිවින ආදි උපද්‍රව දුරු කිරීම ය. මණ්ඩප පුරාණය යනු පද්‍ය පන්තීන් ද්විත්වයකින් යුක්ත වූවකි. ශාන්තිකර්මයක් පැවැත්වීමේ දී එම රඟමඬල සකස් කළ යුතු ආකාරය පිළිබඳ පූර්ණ විස්තරයක් එහි අන්තර්ගත වේ. ගී මඬුව සහ සූනියම සඳහා එම පද්‍ය පන්තීන් භාවිත වනු දක්නට ඇත. මෙම පර්යේෂණයේ ගැටලුව වෙන් වන්නේ ඌවේ පැවැත්වෙන මෙම ශාන්තිකර්ම දෙකෙහි අන්තර්ගත මණ්ඩප පුරාණය නම් පද්‍ය සාහිත්‍යය මගින් භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ අන්තර්ගත මූලධර්මයන් ප්‍රකට වේ ද? යන්න යි. මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කෙරිණි. ප්‍රාථමික මූලාශ්‍ර යටතේ සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ ක්‍රමවේද යොදා ගැනිණි. ඌව පළාතේ බෙරගල, දියතලාව, හල්පේ, කරදගොල්ල, බුත්තල, පැල්වත්ත, කොටගම, වැදි කුඹුර, බූටාරාව, මල්ලැහැව, ගලඋඩ, ගෝඩුන්න යන ප්‍රදේශයන්හි වෙසෙන පාරම්පරික ශිල්පීන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමත් ඔවුන්ගෙන් ලබාගන්නා අත්පිටපත් පරිශීලනය කිරීමෙන් මෙම පර්යේෂණය සිදු කරන ලදි. ද්විතීයික මූලාශ්‍ර යටතේ පුස්තකාල අධ්‍යයනය මගින් කරුණු සොයා ගන්නා ලදි. ඒ අනුව භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ අන්තර්ගත ප්‍රේක්ෂාගෘහ නිර්මාණය, ප්‍රේක්ෂාගෘහ ආරක්ෂාව, රංග පූජා පැවැත්වීම්, ප්‍රේක්ෂාගෘහ ප්‍රභේද, භූ පරීක්ෂා, නූල් එළීම, පදනම දැමීම, ස්ථම්භ ස්ථාපන, මත්තවාරණී යන රංග මණ්ඩපය ඉදි කිරීම පිළිබඳ මූලධර්ම ඌවේ මණ්ඩප පුරාණ සාහිත්‍යයේ ඇතුළත් මූලධර්ම හා සමාන වනු දක්නට ඇත. මෙම දත්ත විශ්ලේෂණය මගින් ගී මඬු සූනියම් ශාන්තිකර්මයේ අන්තර්ගත මණ්ඩප පුරාණය නම් පද්‍ය රචනා වීමෙහි ලා භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රීය මූලධර්ම පදනම් ව ඇති බව මෙතුළින් නිගමනය කළ හැකි ය.

***මුඛ්‍ය පදඃ*** මණ්ඩප පුරාණය, නාට්‍ය ශාස්ත්‍රය, භරතමුනි, ඌව පළාත, පද්‍ය